www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**10/11 ශ්‍රේණි** | **සිංහල සාහිත්‍ය රසාස්වාදය** | **ඒකකය 3 - හානා හීය පානා අඬහැරෙන්**

1) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

i. මෙහි සඳහන් ජනකවි අයත් කවි ගණය කුමක් ද?

ii. ජන කවියක් යන්න කුමක්දැයි හඳුන්වන්න.

iii. මෙරට ජනකවි ඉතිහාසය ගැන කියැවෙන යුගය කුමක් ද?

iv. ජනකවි ඉතිහාස ගැන කියැවෙන මූලාශ්‍රය කුමක් ද?

v. එහි සඳහන් ජනකවි ඉතිහාසය ගැන කියැවෙන කථාව කෙටියෙන් ලියන්න.

vi. කෘෂිකර්මය ආශ්‍රිත ජනකවි වර්ග තුනක් (03) නම් කරන්න.

vii. කාලයෙන් කාලයට ප්‍රදේශයෙන් ප්‍රදේශයට ජනකවි වෙනස් වන්නේ ඇයි?

viii. විවිධ රැකියා ආශ්‍රිත ජනකවි වර්ග තුනක් (03) නම් කරන්න.

ix. ආගමික විශ්වාස හා ඇදහිලි ආශ්‍රිත ජනකවි මොනවා ද?

x. විවේකය, විනෝදයෙන් හා දැනුම ලබා ගැනීමේ අරමුණින් පැවත ආ ජනකවි වර්ගය කුමක් ද?

2) පාඩම ආශ්‍රිත කවි හා සම්බන්ධ පහත සඳහන් වචනයන්හි දුරවබෝධ ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| i) | කඬිසරෙන් | ii) | සකිය |
| iii) | බොරැල්ල | iv) | යක්දෙබරේ |
| v) | පැයුමෙන් | vi) | අඬහැරෙන් |
| vii) | ගොඩැල්ල | viii) | කග |
| ix) | ගිනිහුළ | x) | අමුතුබත්දීම |

3) මතකය ආවර්ජනය කරමින් පහත සඳහන් කවිවල හිස්තැන් පුරවන්න.

i. ........................................................................................

........................................................................................

අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දුනේ

හානා හීය පානා අඬහැරෙන් දුනේ

ii. වරද පෙනෙන තරමට වැරදුණා නොවේ

වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ

........................................................................................

........................................................................................

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

iii. අඳුරු කරුවලේ පැදුරට මුවා වෙලා

..........................................................................................

අනුන් ලියන් දැක තම ලියට තල තලා

..........................................................................................

iv. ..........................................................................................

දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද

v. ..........................................................................................

යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

vi. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද

..........................................................................................

..........................................................................................

..........................................................................................

4) විචාර ප්‍රශ්න

1) ජන කවිය ඔප් නැංවීමට බල පෑ ඇත්තේ,
i) උචිත උපමා භාවිතයත්
ii) සරල වාංමාලා භාවිතයත් බව විස්තර කරන්න.
(එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සෑහේ)

2) i) නිරායාස එළිවැට භාවිතය
ii) ධ්වනිපූර්ණ වචන භාවිතය
හානා හීය සාර්ථක වීමට බලපෑ ඇති අයුරු පහදන්න.
(එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සෑහේ)

3) නියෝගයක් ලෙස නොව සාහිත්‍යාත්මක අයුරින් ජීවිතයට අවශ්‍ය සදුපදේශ ලබා දීමට ජන කවියා සමත්කම් දක්වා ඇති අයුරු නිදසුන් තුනක් ගෙන පැහැදිලි කරන්න.

සැකසුම:-දයානන්ද ගම්මන්පිල මයා

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!